# 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයෙහි ශිෂ්‍ය සාධනය සඳහා බලපාන සාධක

ඒ. එන්. විජේසිංහ
ජා. ශි. වි. ඩි. සම්මාන (නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය),
බී.ඒ. (රුහුණු විශ්වවිද්‍යාලය),
ලලිත කලාවේදී උපාධිය (සෞන්දර්ය විශ්වවිද්‍යාලය)
ප. උ. අ. ඩි. සම්මාන (කොළඹ විශ්වවිද්‍යාලය)
50807590

අධ්‍යාපනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය

ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය
අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
2013 දෙසැම්බර්

OPEN UNIVERSITY
70890
70890

# සාරාංශය

5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණය යනු විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ පාසල්වල 5 ශ්‍රේණියේ දී සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලබන, ජාතික මට්ටමින් කෙරෙන මුල්ම තේරීමේ පරීක්ෂණයයි. මෙම පරීක්ෂණයේ දී තම පළාතට අදාළ කඩඉම් ලකුණු අනුව සිසුනට වරප්‍රසාද ලැබීම හෝ නොලැබීම හෝ තීරණය වේ. සසිසුන් සමත්වීම හා අසමත් වීම නිර්ණය වනුයේ එහි දී ඔවුන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය මත ය. සිසුනට එම ලකුණ ලබාගැනීම සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය තුළින් සිදු කෙරේ.

1944. 02. 10 දින දරණ අධ්‍යාපන විධායක කාරක සභා තීරණය මත දිළිඳු දරුවන්ට නොමිලේ උසස් අධ්‍යාපන පහසුකම් ලබාදීමේ අරමුණින් මධ්‍ය මහා විද්‍යාලවලට සිසුන් තෝරා ගැනීම සඳහා මෙම ශිෂ්‍යත්ව පරීක්ෂණය ආරම්භ වුණි. (කන්නන්ගර වාර්තා, 1943) වරින් වර විවිධ සංශෝධනයන්ට ලක්වෙමින් පරමාර්ථ හා අරමුණු පුළුල් වෙමින් 1960 පාසල් රජයට පවරා ගැනීමෙන් පසු නගරවල ප්‍රධාන ජනප්‍රිය පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමට පවත්වනු ලබන දැඩි තරගකාරී විභාගයක් බවට වර්තමානය වන විට මෙම පරීක්ෂණය ක්‍රමයෙන් පත් විය.

මෙම පරීක්ෂණයෙන් සමත් වී ජනප්‍රිය පාසල්වලට ප්‍රවේශ වන සිසුන් එම පාසල් හරහා උසස් අධ්‍යපන ක්ෂේත්‍රයට ප්‍රවේශ වී ගරුත්ව රැකියා ලබා ගනිමින් ඉහළ සමාජ ස්ථරයන්ට සංචලනය වීම සුලභ ප්‍රවණතාවකි. මේ නිසා සිසුන් ඉහළ මට්ටමින් සමත්කරලීම සඳහා ඊට සහාය වීමට දෙමාපියන් දැඩි උනන්දුවකින් ක්‍රියාකරන ආකාරයක් දක්නට ලැබේ. එහි දී මෙම පරීක්ෂණයට පෙනී සිටින සිසුන්ගේ සාධනය සඳහා බලපාන සාධක මොනවාදැයි යන්න දැන සිටීම අධ්‍යයන ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට, දෙමාපියන්ට හා ශිෂ්‍යයන්ට එකසේ වැදගත් වනු ඇත.

මෙම පර්යේෂණයේ මූලික අරමුණු කිහිපයකි. 5 ශ්‍රේණිය සිසුන් මුහුණ දෙන වාර පරීක්ෂණ ලකුණු හා ශිෂ්‍යත්ව පරීක්ෂණයෙහි ලකුණු අතර ඇති සහසබඳතාව, 5 ශ්‍රේණියේ දී සිදු කරනු ලබන ශිෂ්‍ය තක්සේරු කිරීම හා ශිෂ්‍යත්ව පරීක්ෂණ ලකුණු අතර ඇති සහසබඳතාව, ශිෂ්‍යයා සම්බන්ධ සාධක හා ශිෂ්‍යත්ව පරීක්ෂණයෙහි ලකුණු අතර ඇති සහසබඳතාව සහ සිසුන්ගේ පවුල සම්බන්ධ සාධක හා ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු අතර ඇති සහසබඳතාව මෙම පරීක්ෂණයේ ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් ලැබූ හා නොලැබූ නියදිවල වෙන් වෙන් වශයෙන් පරීක්ෂාවට ලක් කිරීම ඒ අතර වේ.

මෙම අරමුණු සාධනයෙහි ලා බහුවිධ නියදියක් තුළින් දත්ත රැස්කළ අතර එම දත්ත සංඛ්‍යා විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා වඩාත් සුදුසු සමීක්ෂණ ක්‍රමය මෙහි දී යොදා ගනු ලැබී ය. 2011 ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි සිසුන්ගෙන් ශිෂ්‍යත්වයක් ලබාගැනීමට සුදුසුකම් ලැබූ හා නොලැබූ සිසුන් 80 ක්, මාතර දිස්ත්‍රික්කයේ මාතර අධ්‍යාපන කලාපය තුළ

පාසල් 4 කින් අහඹු ලෙස තෝරා ගැනුණු අතර ඔවුන්ගේ දෙමාපියන් හා ගුරුවරුන් මෙහි නියදිය ලෙස යෙදා ගැනිණි. දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප හා උපකරණ යෙදා ගනු ලැබුයේ වාර්තා සමීක්ෂණ, ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ය. සිසුන්ගේ 5 ශ්‍රේණියේ වාර පරීක්ෂණ ලකුණු සහ ප්‍රධාන විෂයන්වල ශිෂ්‍ය තක්සේරු වාර්තා සටහන් මෙහි වාර්තා සමීක්ෂණ ලෙස යොදා ගැනුණු අතර ප්‍රශ්නාවලි ලෙස ශිෂ්‍ය ප්‍රශ්නාවලියක් සහ දෙමාපිය ප්‍රශ්නාවලියක් යොදා ගනු ලැබී ය. සම්මුඛ සාකච්ඡා තෝරා ගත් ගුරු නියදිය සමඟ සිදු කරනු ලැබී ය.

මෙම උපකරණ තුළින් ලබාගත් දත්ත සංඛ්‍යා විද්‍යාත්මකව ශිෂ්‍යත්වයක් ලබාගැනීමට සුදුසුකම් ලැබූ හා නොලැබූ නියදිවල වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කරන ලදී. එහි දී මධ්‍යයනය, සම්මත අපගමනය, සම්මත අපගමන දෝෂය, සහසම්බන්ධතා සංගුණකය සහ විසිරි තිත් සටහන් ඒ සඳහා යොදා ගනු ලැබී ය. එ මගින් පර්යේෂණය අවසානයේ විවිධ නිගමනයන්ට එළඹීමට පර්යේෂිකාවට හැකි විය.

එහි දී ශිෂ්‍යත්ව පරීක්ෂණයෙහි ප්‍රතිඵල පෙරකීමේ නිර්ණායකයක් ලෙස 5 ශ්‍රේණිය වාර පරීක්ෂණ ලකුණු යොදා ගත හැකි බව, ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ශිෂ්‍ය සාධනය පුරෝකථනය කිරීම සඳහා පාසල් ශිෂ්‍යා තක්සේරු වර්තා සටහන් වලංගු නොවන බව, ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ශිෂ්‍ය සාධනය හා පර්යේෂිකාව විසින් පරීක්ෂා කරනු ලැබූ ශිෂ්‍ය සාධක අතර ධන සහසම්බන්ධයක් පවතින බව හා ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ශිෂ්‍ය සාධනය හා පර්යේෂිකාව විසින් පරීක්ෂා කරන ලද සිසුන්ගේ පවුල සම්බන්ධ සාධක අතර ඉහළ ධන සහසම්බන්ධයක් පවතින බව වැදගත් නිගමනයන් ලෙස මෙහි දී අනාවරණය විය .

ඒ අනුව විවිධ පර්යේෂණ යෝජනා ද පර්යේෂිකාව විසින් පර්යේෂණය අවසානයේ දක්වා ඇත. ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටින සිසුන් පාසල් වාර පරීක්ෂණ සඳහා ලබා ගන්නා ලකුණු පිළිබඳව ගුරුවරුන් මෙන් ම දෙමාපියන් සැලකිලිමත් විය යුතු අතර එහි දී අඩු ලකුණු ලබා ගන්නා සිසුන්ට ප්‍රතිකාර්ය වැඩසටහන් පාසල් මට්ටමින් ක්‍රියාත්මක වීම වැදගත් ය. දෙමාපියන් ද මේ සම්බන්ධයෙන් දැනුවත් කළ යුතු ය. එමෙන් ම පාසල් ශිෂ්‍ය තක්සේරු වාර්තා සටහන් සම්පූර්ණ කිරීමේ වැදගත් කම පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීම අවශ්‍ය අතර එය ක්‍රියාත්මක කිරීමේ දී අධීක්ෂණයක යොමු වීම වැදගත් ය. එමෙන් ම සිසුන් පෞද්ගලික උපකාරක පන්තිවලට යැවීම පමණක් ශිෂ්‍යත්ව පරීක්ෂණය සමත් වීමට හේතු නොවන බව මෙන් ම දෙමාපියන් තමන්ට හැකි පමණින් තම දරුවන්ට නිවෙස් මට්ටම ප්‍රතිජනනාත්මක පරිසරයක් සැකසීමේ වැදගත් කම පිළිබඳව ගුරු - දෙමාපිය රැස්වීම්වල දී අවධානය යොමු කිරීම කළ යුතු ය. එමෙන් ම දෙමාපියන් තුළ ධනාත්මක සිතුවිලි ඇති කිරීමෙන් ආර්ථික දුෂ්කරතා ඇති සිසුන්ට මෙම පරීක්ෂණයෙන් ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් ලැබීමෙන් ඇති වාසි පිළිබඳව දැනුවත් කිරීම ද අවශ්‍ය ය. තව ද ශිෂ්‍යත්ව පරීක්ෂණයට සූදානම් වන කාල සීමාව තුළ සිසුන්ට මෙන් ම දෙමාපියන් ට ද ඔවුන්ට ගැලපෙන උපදේශන සේවා පාසල් මට්ටමින් ක්‍රියාත්මක වීම වැදගත් බව ඒ අතර යෝජනා ලෙස දක්වා ඇත.

## Summery

Grade Five Scholarship Examination is a systematic Educational activity in which grade 5 students are tested for the first time in Sinhala and Tamil medium in a national level. The students gain privileges according to the cut off marks level for the respective districts. This research deals with the factors that help students to gain marks at the Scholarship Examination.

In 1944, February, 10th the Educational Executive Committee decided to grant the opportunity to children of poor families for Higher Educational facilities free. So that such children could gain entrance to Central Schools. This is according to the report based on Dr.C.W.W.Kannagara on free Education. (Kannagara report ,1943). At present it has become a very competitive exam which enables students to gain entrance to popular schools. Such students are able to enter the higher Education field and ultimately acquire honorable jobs. As such students and parents are interested in acquiring higher marks at the examination and parents encourage their children for this purpose. There are some fundamental facts that guide this examination. The main objectives of the study are the connection between the marks that students gain in term end exam and scholarship marks, student estimate and scholarship marks, student related factors and scholarship marks, student`s family related factors and scholarship marks and the number of students who pass the scholarship examination and those who fail the examination.

Data for the project was collected through a multiple sample to achieve the objective and the data was analyzed based on statistical and scientific characteristics and decided on the best research method. Reports, questionnaires and interviews were used as data collecting methods and tools. The data thus collected was analyzed separately in the eligible or non eligible sample for a scholarship based on statistical and scientific characteristics.

The main findings of the study are the facility to use grade five term test marks to forecast scholarship marks, the inability to use student assessment reports to forecast scholarship marks, the strong positive relationship between the student achievement at the scholarship exam and the factors related to students and family.